# අසිරිමත් නත්තල



සාම කුමරු ඉපදුණා - පුංචි තරුව බැබළුණා
සමා මිහිර විහිදුණා - මුළු ලෝකෙම ගැළවුණා

සීත රැයේ මව් තුරුලේ උණුසුම පමණයි තිබුණේ
ලෝම වස්ත්‍ර සේද වස්ත්‍ර නෑනේ ගත උණුසුම් කළේ
ගව ගාලේ සාදයේ හිටියේ නෑ බලවතුන්
කන් සොළවා පිළිගන්නේ පදා සතරේ සුරතලුන්

කිරි ගැහෙන සීත රැයේ - ගව ඔරුවෙයි හිස දුන්නේ
පිදුරු ඔතා නිදන කුමරු - අසළ සිටියේ ගොපළුනුයි

ජුසේ පියා පසෙකින් හිඳ පුතු තනියට රැඳෙන්නේ
මරියතුමී ළමැද තුරුළෙ චූටි පුතුව රකින්නී

දේව දූත සේනාවෝ - ප්‍රීති ගීත ගයන්නෝ
දෙවි මහිමය කියන්නෝ - සාම මිහිර බෙදන්නෝ

දිලෙන තරුව නිරිඳු තදෙන ගව ගාලට ගෙනෙන්නේ
පඬුරු පුදා බැතිය පෙමා කුමරුන් බැහැ දකින්නේ
කැකුළු සිනා මව මවා ජේසු පුතා නිදන්නේ
කුරුස ගසේ දිවි පිදුමේ යාගය දැයි දකින්නේ

සාම කුමරු ඉපදුණා - පුංචි තරුව බැබළුණා
සාම මිහිර විහිදුණා - මුළු ලෝකෙම ගැළවුණා

**මරිනි වෙත්තසිංහ**
මිල්පාක්

# කුළුඳුල් මිණිබිරිය වෙත



ලංකා පොළව පීරා එන සුළං වැදී
බෝ පත් සිහිල මුසු බුදුගුණ සවනෙ රැඳී
නා දළු දෙතොළ මද මද සිනහවෙන් බැඳී
කිරිකැටි බිළිඳු සුවසේ මගෙ උකුලෙ නිදී

මී අඹ ගහේ ලේනුන් දුව පනිනවද
මාළගිරවු එබිකම් කර බලනවද
ඇත් පැටවුන් තරඟෙට දිය කෙළිනවද
මා දුටු සොඳුරු ලොව ඔබටත් පෙනෙනවද

අරලිය ගහේ අතු පතරේ හැංගෙන්නම්
රුක් අත්තන සෙවනෙ ඔංචිලි පදවන්නම්
වැලි සෙල්ලම් බතේ රස හඳුනා දෙන්නම්
අසෝකා මලින් ඔබ හිස සරසන්නම්

අතැඟිලි රැගෙන නිල් තණ පිබිදෙන වාරේ
ගෙනයම් දිනෙක ලොකු සීයා ගිය පාරේ
සුරලොව සිටන් දරු පෙම නොමඳව බේරේ
අම්මා මගේ නහවයි කරුණා දහරේ

දුව පිළිගන්න මංගල බෙර හැඬවෙනවා
සැණකෙළි වෙසින් සෙංකඩගල දිළිසෙනවා
දායාදයකි පිය උරුමෙන් හිමි වෙනවා
දළඳා සමිඳු මගෙ කුමරිය රැක දෙනවා

**ලක්ෂ්මී පනාගොඩ මාපා**
*ඇමරිකා එක්සත් ජනපදය*




# ප්‍රේමය
## රන්සිරිමල් ප්‍රනාන්දු

*සූර්යයා තුළ ශක්තිය නිපදවෙන්නේ අධි උෂ්ණත්වයක් හා පීඩනයක් යටතේ ජලකර න්‍යෂ්ඨි හීලියම් බවට විලයනය වීමෙනි.*

දැවී හළුවී නැසී මිස
කිසි දිනක දෝතට
තුරුළු කර ගත නොහෙන
සදාකාලික අග්නි ජාලාවකිය
බුර බුරා දැල්වෙන

මිරිකා තලා පාස්සා
ගිනියම් වූ ජලකර න්‍යෂ්ඨි
මුදා හැර ගිනි
ඇවිලි ඇවිලී දැවෙන
ඉමක් නැති හිස් කමක
ඉඩක් නැති ප්‍රේමයකි
සලකුණක් සටහනක් නැති
කක්ෂයක හරි මැදක්ව
තනිව නැවතී සිටින

නිල්වනින් වියන් බැඳ
හරිතයෙන් පාවාඩ අතුරා
පුබුදුවා මල් කැකුළු
විහිදුවා සුවඳ පැන්
වසන්තය වැඩමවන

සසලවා සයුරු දිය
විසිරුවා පෙණ පොඩිති
තනා පා කර මේ කුළු
දවටා සුළං රැළි අග
වස්සාන වැසි වස්සන

කහ පාට රතු පාට කර
මල් හැලී හැදුණු එළ
රත්තරන් සායමෙන්
කරල් බර ගොයමත් පාට කර
විහඟ තුඩු අග සොඳුරු ගී සර තබන

දැවී හළුවී නැසී මිස
කිසි දිනක දෝතට
තුරුළු කර ගත නොහෙන
සදාකාලික අග්නි ජාලාවකිය
බුර බුරා දැල්වෙන
සලකුණක් සටහනක් නැති
කක්ෂයක හරි මැද
තනිව නැවතී සිටින
ඉමක් නැති හිස් කමක
ඉඩක් නැති ප්‍රේමය

boondi.lk

## වරා මල....ආරම්මණය කිමැයි?
හෂාන් බඹරබොටුව

ලිහී ලිහී සහෝදර කැටියෙන්
අතැර පැටලූම් විහිදාය දුහුල්
අල්ලා දහස් අතකින් නිම්නයේ හිස්කම
මව් ලතාවෙන් මිදෙයි හුළඟ වෙත



හුළඟ ඉන්නේ හුළඟ යන්නේ
මේ අවට කොතැනටද
රික්තයෙහි සරන්නේ
වරා මල දුහුල ඔබ
රික්තයයි හුළඟයි
එකට ගැට ගසන්නේ

හිස්කමක පොඩියකට
පිරවුමක් කරන්නේ
මහද විගසින් එවන් සිත්තම්
හදේ හිර කරන්නේ
පපුව හිර කරන්නේ

රළු පරළු වේගයෙන් ඇඹරෙද්දි
ශාන්තව ලැසි ස්වරය මුමුනද්දි
හිස නවා කරමින් ආචාර
ආධුනික සැරිසරකි පළමුවන පියාසර

boondi.lk



# නිදහස් කරනවද මසිත

කඳු තරම්
ගොඩ නම් ගැහෙයි
සොබා සිරි සර
වචන,
එකදු කවක්වත්
නොලියවණ.

සබඳ
නිදහස් කරනවද
මසිත,
අවසරයක් නැතිවම
සිතැඟි සේ
සිර කෙරුව?

**එරංගා පෙරේරා**



මා එන මොහොත බලා
ඇසිල්ලකින් හිරිකඩ එබී
සිප ගන්න යැයි තෙත කඳුළින්
කියන්නෙද ඔබ අහසට..
දහසකුත් දනන් බලා සිටිද්දි
මල් වැනි සියුම් සිරුවට
මුහුණ අත් පා සියොළඟ
නතු වෙයි හිරිකඩට..
නැමී වැස්සට යටින්
අත රැඳි දෙය කිහිල්ලේ රුවා
සෙවණක් සොයන්නට නොවෙහෙසෙමි..
ඔබ එවූ පින්න මනරම්...

-යසිත් ප්‍රමුදිත සිරිවර්ධන

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com